**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

බදුල්ල

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා වර්ෂ 2024 වෙනුවෙන් ශිෂ්‍ය නේවාසිකාගාර/රියදුරු නේවාසිකාගාර/ සඳහා නිවාස කුලියට /බද්දට සැපයීම**

**බදුල්ල/කොළඹ**

**ටෙන්ඩර් අංක යුඩබ්යු /ජීඒ/05/එල්එච්/2024-2025/01**

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

**බදුල්ල**

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා වර්ෂ 2024 වෙනුවෙන් ශිෂ්‍ය නේවාසිකාගාර/රියදුරු නේවාසිකාගාර/**

**සඳහා නිවාස**

**කුලියට /බද්දට සැපයීම**

**බදුල්ල/කොළඹ**

**ටෙන්ඩර් අංක යුඩබ්යූ /ජීඒ/05/එල්එච්/2024-2025 /01**

**1. ඉල්ලුම් කරුවන් සඳහා උපදෙස්**

1-1 ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා අවුරුද්දක කාළ සීමාවකට ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා නිවාස සැපයිය හැකි **බදුල්ල හා නුගේගොඩ** අවට පුද්ගලයින් හා ආයතන වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ. එම කුලී කාල සිමාව විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත ඉදිරි වර්ෂය සඳහා දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ.

1-2 මිල ගණන් ඉදිරිපත් කිරීම 2024.04.01 වන දින ප.ව 3.15 ට හෝ ඊට පෙර සිදු කළ යුතු අතර මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු (බලයලත් ලිපියක් සමඟ ) සහභාගි විය හැක. මිල කැඳවුම බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අදාල මිල කැඳවුම් අංකය සඳහන් කල යුතු අතර මිල ගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරි (පාලන), ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල වෙත එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. තැපැල් ප්‍රමාදයක් හෝ වෙනයම් හේතුවක් මත සිදු වන ප්‍රමාදයන් සඳහා විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.

1-3 ටෙන්ඩර්පත් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

1-4 සේවා අවශ්‍යතාව මත ගිවිසුම්ගත කාළ සීමාවෙන් පසුව වුවද නිවාස සැපයීමට සිදුවිය හැක.

**2. ටෙන්ඩර් කොන්දේසි**

2-1 නේවාසිකාගාර සඳහා ලබා ගන්නා නිවාස වල ජල හා විදුලි බිල්පත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මඟින් ගෙවනු ලබන අතර නිවාස භාර දෙන අවස්ථාවේදී ඒවා හිඟ බිල්වලින් තොර විය යුතුය. (හිග බිල්පත් පැවතියේ නම්, ඒවා පළමු මස කුලියෙන් අඩු කරනු ලැබේ.)

2-2 නිවාස භාර දීමේදි පදිංචියට සුදුසු පරිදි සකස් කර භාර දිය යුතු අතර බදු කාළ සීමාව තුළදී සියලුම ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු බදු හිමියා විසින් වහාම සිදු කළ යුතු අතර එවැනි අළුත්වැඩියාවක් හෝ නඩත්තුවක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් කළේ නම් එය මාසික කුලියෙන් අඩු කරනු ලැබේ.

2-3 මාසික බදු මුදල ඊලග මාසයේ 15 වෙනි දිනට පෙර ගෙවනු ලැබේ.

2-4 ගිවිසුම් කාලය තුළදී කුමන හෝ පාර්ශවයක් නිවාස ඉවත් කරන්නේ නම් එක් මසක කල් දීමක් සහිතව ඉවත් විය යුතුය. එසේ කල් දීමකින් තොරව ඉවත් කරගතහොත් අවසන් මාසයේ බදු මුදල් විශ්වවිද්‍යාලය රඳවා ගනු ලැබේ.

2-5.1 ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කුලී මුදල හා රජයේ තක්සේරු ඇස්තමේන්තු මුදල යන දෙකම පිළිබඳ සැලකිල්ලට යොමු කරනු ලැබේ.

2-5.2 ජල හා විදුලි බිල්පත් වලට අමතරව වෙනත් කිසිදු බිල්පතක් **විශ්වවිද්‍යාලය මඟින් ගෙවනු නොලැබේ.**

2.6 වර්ග අඩි 1200 හෝ ඊට වැඩි නිවාස (වඩා විශාල නිවාස) සඳහා ප්‍රමුඛතාවය ලැබේ.

2-6.1 නේවාසික ශිෂ්‍ය ධාරිතාවට පහසුකම් සැපයිය හැකි තරම් වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතුය.

2-6.2 විශ්වවිද්‍යාලයෙන් සිදු කරන නඩත්තු කටයුතු හා වෙනත් අවශ්‍යතා වලදී ගොඩනැගිල්ලේ ගෙවත්ත තුලට ප්‍රවිශ්ඨ විය හැකි, ප්‍රමාණවත් හා නිසි තත්වයේ පවතින මාර්ග පහසුකම් කෙරෙහි ප්‍රමුඛතාවය ලැබේ.

2-6.3 නිවසක කොටසක් හෝ මහලක් ලබා දෙන්නේ නම් ජලය හා විදුලිය සැපයුම වෙනම තිබිය යුතු අතර වෙනම ඇතුල්වීමේ පහසුකම්ද තිබිය යුතුය.

2-6.4 නිවාස සඳහා ජල සැපයීම ජාතිකජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් සපයන ජල පහසුකම් විය යුතුය. ඒ සඳහා ප්‍රමුඛතාවය ලැබේ.

2-6.5 සෑම කාමරයකටම ස්වභාවික වාතාශ්‍රය සහ සෑම කාමරයකටම ස්වාභාවික හිරු රශ්මිය ලැබිය යුතුය.

2-6.6 ගෙවත්ත ආරක්ෂිත වැටකින් / තාප්පයකින් වෙන් වී තිබිය යුතුය.

2-7 පාලක සභාව විසින් අනුමත කරන පරිදි ගෙවීම් හා විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන අනෙකුත් කොන්දේසි වලට බදු හිමියාට එකඟ වීමට සිදු වේ.

2-8 අසාදු ලේඛනගත ආයතන හා පුද්ගලයින්ගෙන් හා විශ්ව විද්‍යාලය සමග ඍජු සබඳතා ඇති ආයතන හා පුද්ගලයින්ගේ ලන්සු පත් ප්‍රතික්ෂේප කෙරේ.

## 3. අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමට උපදෙස්

3-1 ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම ජාතික හැඳුනුම්පතේ / රියදුරු බලපත්‍රයේ / විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් පරිදි විය යුතු අතර ඒ බව සනාථ කිරීමට එහි ඡායා පිටපත් ඇමිණිය යුතුය.

3-2 විශ්වවිද්‍යාලයට නිවාස හිමියා සමඟ ලිපි ගනුදෙනු කිරීමට හැකි ලිපිනයක් නිවාසහිමියාගේ ලිපිනය ලෙස සඳහන් කළ යුතුය.

3-3 අදාළ මාසික වාරික මුදල තැම්පත් කිරීම සඳහා බදු හිමියා අපේක්ෂා කරන සක්‍රීය බැංකු ගිණුම් පාස් පොතේ පිටපතක් ඇමිණිය යුතුය.

3-4 කුලියට ලබා දෙන නිවාසයේ මාස 06ක් ඇතුලත මාසික කුලිය පදනම් කරගත් තක්සේරු වාර්තාවක් ඇමිණිය යුතුය.

3-5 කුලියට දෙනු ලබන නිවසට ළඟා වන ගමන් මාර්ගය දැක්වෙන දළ සිතියමක් ඇමිණිය යුතුය. ( දුර සමඟ )

3-6 කුලියට දීමට අපේක්ෂිත නිවසේ අයිතිය තහවුරු කිරීමට ඔප්පුවේ / බලපත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය.

3-7 කාමරවල දිග, පළල සහිත සැලැස්ම දැක්වෙන සටහනක් ඇමිණිය යුතුය.

3-8 කුලියට දීමට අපේක්ෂිත නිවසේ අයිතිය ටෙන්ඩර්කරුගේ විය යුතු අතර එසේ නොවන අවස්ථා වලදී නීත්‍යානුකූලව හිමිකම ලැබෙන ආකාරය ඉදිරිපත් කළ යුතුය.

3- 9 ගෙවීම් සිදු කිරීමේදී රජය විසින් පනවනු ලබන බදු මුදල් සලකා බලනු ලැබේ.

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට නිවාස කුලියට/ බද්දට දීමේ අයදුම් පත්‍රය**

**<u>ටෙන්ඩර් අංක යූඩබ්යූ/ජීඒ/05/එල්එච් /2024-2025/01</u>**

**1. නිවාස හිමියාගේ විස්තර**

1-1 ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :- ..............................................................................

..............................................................................

1-2 ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................................................

1-3 ස්ථිර ලිපිනය :- ..............................................................................

..............................................................................

..............................................................................

1-3.1 ලිපි ලැබෙන ලිපිනය :- ..............................................................................

(ඉහත ලිපිනයෙන් වෙනස් වේ නම් පමණි) ..............................................................................

..............................................................................

1-4 දුරකථන අංකය - ජංගම :- ..............................................................................

ස්ථාවර :- ..............................................................................

1-5 බැංකු ගිණුම් විස්තර :- 1.5.1 ගිණුම් අංකය :- ......................................

1.5.2 බැංකුව හා ශාඛාව :- ......................................

..............................................................................

1-6 වෙනත් තොරතුරු :- ..............................................................................

..............................................................................

**2. කුලියට බද්දට දීමට අපේක්ෂිත නිවසේ පොදු විස්තර**

2-1 අයිතිකරුගේ සම්පූර්ණ නම :- ..............................................................................

..............................................................................

2-2 ලිපිනය :- ..............................................................................

(බදු දීමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ) ..............................................................................

2-3 අපේක්ෂිත මාසික කුලිය :- ..............................................................................

2-4 ජලය රදවනයේ ධාරිතාව :- ..............................................................................

2-5 විශ්වවිද්‍යාලයේ සිට නිවසට ඇති දුර (Km) :- ..............................................................................

2-6 ජලය හා විදුලි මීටර වල ගිණුම් අංක :-

ජලය :- ..............................................................

විදුලිය :-..............................................................

(ආසන්න බිල්පත් වල පැහැදිලි පිටපත් අමුණන්න)

2-7 නිවසේ ප්‍රමාණය (වර්ග අඩි) :-..............................................................................

2-8 කාමර සංඛ්‍යාව :- ........................................................................

2.9 වැසිකිලි හා නාන කාමර ගණන :- ........................................................................

2.10 ලබා දෙන ගෘහ භාණ්ඩවල විස්තරය -..............................................................................

ටෙන්ඩර් කොන්දේසි හොඳින් කියවා බලා අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට උපදෙස් වල දක්වා ඇති 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7 හා 3.8 යන ලේඛනද මේ සමඟ අමුණා මෙම මිල ගණන් ඉදිරිපත් කරන බව දන්වමි. එය තහවුරු කිරීම සඳහා පහත එක් එක් හිස්තැන හරි ලකුණ (V) යොදන්න.

| **කොන්දේසි අංකය** | **අමුණා ඇති බව (V)** |
|---|---|
| 3.1 | |
| 3.2 | |
| 3.3 | |
| 3.4 | |
| 3.5 | |
| 3.6 | |
| 3.7 | |
| 3.8 | |

ලබා දෙන ගෘහ භාණ්ඩවල විස්තර

| **ගෘහ භාණ්ඩය** | **සංඛ්‍යාව** |
|---|---|
| ඇඳ | |
| මෙට්ට | |
| පුටු | |
| මේස | |
| කබඩ් | |
| ටවල් රැක් | |
| | |
| | |

............................................. ..............................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය